# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1829/36 - 2013 සැප්තැම්බර් 26 වැනි බ්‍රහස්පතින්දා - 2013.09.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978 **(X)**

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) (ආ) වගන්තිය සමග කියවිය යුතු 25(අ) වගන්තිය යටතේ වූ නියමය

**නිවේදනය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) (ආ) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, මෙම නියමය මගින්, ඉහත කී පනතේ 70 ඈ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, එකී පනතේ 25අ වගන්තිය යටතේ මා විසින් කරන ලද සහ 2011 අගෝස්තු මස 30 දින අංක 1721/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබුවා වූ පහත දැක්වෙන පරිදි වෛද්‍ය විද්‍යාවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (එම්බීබීඑස්) උපාධිය පිරිනැමීම සඳහා ඉවහල්වන උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, (SAITM) පිළිගනු ලබන්නා වූ නියමය සංශෝධනය කරමි :-

1. 2009 සැප්තැම්බර් මස 15 වන දින සිට 2011 අගෝස්තු මස 29 වන දින දක්වා වූ කාලසීමාව තුළදී සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, (SAITM) තුලින් රුසියාවේ නිස්නි නොව්ගෝඩ් ස්ටේට් මෙඩිකල් ඇකඩමිහි දී (Nizhny Novgorod State Medical Academy Russia) වෛද්‍යාචාර්ය (MD) උපාධිය සඳහා ලියාපදිංචි වී ඇති සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ විශ්වවිද්‍යාල සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්

1A PG 1764 - 650 (2013/09)

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සපුරාලන සහ සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, (SAITM) මගින් ප්‍රදානය කරනු ලබන වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (එම්බීබීඑස්) උපාධිය සඳහා වූ අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට ස්වකීය අධ්‍යයන පාඨමාලාව වෙනස් කිරීමට එකඟවන්නා වූ ශිෂ්‍යයන් සඳහා, එකී ශිෂ්‍යයන් සම්බන්ධයෙන් වූ සියලු කාර්ය සඳහා පමණක් මෙහි උපලේඛණයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව 2009 සැප්තැම්බර් මස 15 වන දින සිට ඉහත කී නියමය බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතුය.

2. ඉහත කී නියමයේ උපලේඛනයේ :-

(අ) 4 වන අයිතමයන්ට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුලත් කිරීමෙන් :-

"4අ. 2013 සැප්තැම්බර් මස 26 දින සිට මාස හයක කාලයක් ඇතුලත සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, (SAITM) භාර ඔප්පුව ලියා අත්සන් කිරීම සහ එම ඔප්පුවේ විධිවිධාන ප්‍රකාරව සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ, (SAITM) කොටස්වලින් 51%ක් භාරයක් වෙත පැවරීම." ;

(ආ) 6 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම ඇතුලත් කිරීමෙන් :-

"6අ. 2013 සැප්තැම්බර් මස 26 දින සිට මාස හයක කාලයක් ඇතුලත මූල්‍ය සහ මෙහෙයුම් මාර්ගෝපදේශ හඳුන්වාදීම මගින් සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ, (SAITM) මූල්‍ය පාලනය ශක්තිමත් කිරීම.

6ආ. 2013 සැප්තැම්බර් මස 26 දින සිට මාස හයක කාලයක් ඇතුලත ණය ප්‍රමාණය සම කොටස් ප්‍රාග්ධන අනුපාතිකය (ප්‍රාග්ධන සැකසුම් අනුපාතිකය) 70:30 ලෙස, දක්වා හෝ ඊට පහල අගයක් සඳහා ප්‍රවර්ධනය කිරීම සහ ඉන්පසුව එම අනුපාතිකය 70:30 ලෙස, දක්වා හෝ ඊට පහල අගයක් සඳහා අඛණ්ඩව පවත්වා ගැනීම. " ; සහ

(ඇ) 7 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුලත් කිරීමෙන් :-

"7අ. 2013 සැප්තැම්බර් මස 26 දින සිට මාස හයක කාලයක් ඇතුලත වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (එම්බීබීඑස්) උපාධියට අදාල පෙල පොත් සහ වාර සඟරා සැපයීම මගින් පුස්තකාල පහසුකම් ප්‍රවර්ධනය කිරීම."

## උපලේඛනය

අදාළ ශිෂ්‍යයන් සඳහා කිසිම අතිරේක පාඨමාලා ගාස්තුවකින් තොරව සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, (SAITM) මගින් ප්‍රදානය කරනු ලබන වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (එම්බීබීඑස්) උපාධිය සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට පහසුවන පරිදි, මෙම නියමයේ දින සිට එක් අවුරුද්දක කාලයකින් මෙම නියමයේ සඳහන් ශිෂ්‍යයන් සම්බන්ධයෙන් අධ්‍යයන කාලසීමාව සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය, (SAITM) විසින් දීර්ඝ කරනු ලැබේ.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2013 සැප්තැම්බර් මස 26 දින,
කොළඹ දී ය.

10- 363

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.